සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I | කාලය / காலம் / Time පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ශුද්ධ බයිබලයේ පුද්ගල හෝ ජනතා ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කර ඇති ඓතිහාසික කෘති දෙක වන්නේ,
1. එස්රා හා නෙහෙමියා කථාව
2. ජෝෂුවා හා එස්තර් කථාව
3. රූත් හා එස්තර් කථාව
4. ගීතාවලිය හා ගනන් කථාව

(02) පුරාණ ගිවිසුමේ එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි
1. එස්රා
2. දානියෙල්
3. හිතෝපදේශය
4. ගීතාවලිය

(03) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇත්තේ................ "අක්කායා" නම් ස්ථානයේ දීය.
1. ගලීලයේ
2. රෝමයේ
3. ජෙරුසෙලමේ
4. ග්‍රීසියේ

(04) ශුද්ධ වූ පාවුලු තුමා විසින් ලියන ලද නව ගිවිසුමේ හසුන් පත් සංඛ්‍යාව වන්නේ,
1. $\frac{02}{21}$
2. $\frac{08}{21}$
3. $\frac{04}{21}$
4. $\frac{13}{21}$

(05)




ඉහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ
2. ප්‍රඥා සාහිත්‍යයේ ලක්ෂණ
3. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ලක්ෂණ
4. රාජ්‍ය සභාවේ ලක්ෂණ

(06) ජීවිත හරය, එහි ගැටලු, විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයකි.
1. රාජ්‍ය සභා ප්‍රඥාව
2. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව
3. අභිධාර්මික ප්‍රඥාව
4. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව

(07) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ වන්නේ,
A. හිතෝපදේශය
B. තෝබිත්
C. ධර්මදේශකයා
D. විරාවලිය
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
1. A,B හා D ය
2. A හා C ය
3. B හා C ය
4. A හා D ය

(08) එළිදරව් සාහිත්‍යයේ එන බැටළුවාගේ සංකේතයෙන් ඉදිරිපත් කරන්නේ,
1. දේව ජනතාව
2. ක්‍රිස්තුන් වහන්සේ
3. දෙවියන් වහන්සේ
4. ආත්මයාණන් වහන්සේ

(09) ජේසුස් වහන්සේ පාස්කු ඉරු දින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩම කර..............................
පවසමින් ඔවුන් ශක්තිමත් කළ සේක.
1 "ඔබට ශාන්තිය වේවා යි"
2. "ඔබට සාමය වේවා යි"
3. "ඔබට ශක්තිය ලැබේවා යි"
4. "ඔබට ප්‍රේමය වේවා යි"

(10) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙන ගිය පසු ජේසුස් වහන්සේව රැගෙන ගියේ කොහේටද?
1. හෙරොද් වෙත
2. අරමාතියේ ජෝසෙප් වෙත
3. උත්තම පූජක මැදුර වෙත
4. පිලාත් ආණ්ඩුකාරයා වෙත

(11) ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වන්නේ,
1. ශුද්ධ වූ ස්තේපන් තුමාය
2. ශුද්ධ වූ පේදුරු තුමාය
3. ශුද්ධ වූ පාවුලු තුමාය
4. ශුද්ධ වූ ජාකොබ් තුමාය

(12) ශුද්ධ වූ පාවුලු තුමා අයත් ගෝත්‍රය වන්නේ,
1. ජුදාගේ
2. ලෙවීගේ
3. බෙන්ජමින්ගේ
4. සිමියොන්ගේ

(13) ශුද්ධ වූ පාවුලු තුමා පළමු ධර්ම දූත ගමනේදී ගිය නගර වූයේ,
A. අන්තියෝකය
B. බෙරියාව
C. ඉකෝනිය
D. එපීසය

ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ,
1. A හා B ය
2. B හා C ය
3. A,B හා C ය
4. A හා C ය

(14) 1973 ආර්ජන්ටිනාවේ ජේසු නිකායික ප්‍රදේශාධිපති තනතුරට පත් වූයේ,
1. අති උතුම් 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් ය
2. අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ය
3. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමන් ය
4. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමන් ය

(15) "මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නගන්නෙමි. මරණයේ බලයට වුවද එය පරාජය කළ නොහැක" මෙය කා විසින් කා හට කියන ලද්දක්ද?
1. ජේසුස් වහන්සේ විසින් අපෝස්තුලුවරුන්ට
2. පේදුරු තුමා විසින් ශ්‍රාවකයන්ට
3. ජේසුස් වහන්සේ විසින් පේදුරු තුමන්ට
4. පාවුලු තුමා විසින් ජොහන් මාක් ට

(16) ශුද්ධ වූ සභාවේ ලක්ෂණ වන්නේ,
1. ඒකත්වය / ශුද්ධත්වය / අපෝස්තලිකත්වය
2. සහභාගිකම / යාච්ඤාව / ඉගැන්වීම
3. රොටි කැඩීම /ඒකත්වය / අපෝස්තලිකත්වය
4. ඉගැන්වීම / යාච්ඤාව / රොටි කැඩීම

(17) ප්‍රසාද ස්ථාපනය ලැබූ අය ජේසුස් වහන්සේගේ ............................................ අවයවයෝ වෙති. හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය
2. මුල්කිතුනු සභාවේ
3. ශුද්ධ වූ සභාවේ
4. මිසම් සභාවේ

(18) පෘතුගීසි සමයේ ලංකාවට පැමිණි ධර්ම දූත කණ්ඩායම් වන්නේ,

1. ප්‍රැන්සිස්කාන නිකාය / නිර්මල මරිය නිකාය / ජේසු නිකාය / අගුස්තීනු නිකාය
2. ජේසු නිකාය / මාරිස් පැවිදි නිකාය / නිර්මල මරිය නිකාය / ප්‍රැන්සිස්කාන නිකාය
3. ප්‍රැන්සිස්කාන නිකාය / ජේසු නිකාය / දොමිනිකාන නිකාය / අගුස්තීනු නිකාය
4. දොමිනිකාන නිකාය / නිර්මල මරිය නිකාය / ජේසු නිකාය / මාරිස් පැවිදි නිකාය

(19) "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටුකර ගත නොහැකිය" මෙසේ පැවසුයේ,

1. ගෞරවනීය ජාකොමේ ගොන්සාල් වේස් පියතුමා ය
2. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය
3. භාග්‍යවත් තෙරේසා මව්තුමිය ය
4. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය

(20) "ප්‍රසාද නිධානයන්ගේ ප්‍රසාද නිධානය" ලෙස හඳුන්වනු ලබන්නේ,

1. අභිවෘද්ධි ආලේපය
2. දිව්‍ය සත්ප්‍රසාදය
3. ප්‍රසාද ස්නාපනය
4. රෝගීන්ගේ ආලේපය

(21) ශුභාරංචි කතුවරුන් හතරදෙනා ම වාර්තා කරන එකම ප්‍රාතිහාර්ය වන්නේ,

1. මාරුත දමනය ප්‍රාතිහාර්ය
2. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය
3. අංශභාගී රෝගියා සුව කිරීමේ ප්‍රාතිහාර්ය
4. වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්ය

(22) "සාලෙම් නුවර පූජක රජතුමෙකු වූ ...................... ප්‍රථම වරට පූප හා මිදියුෂ ගෙන, දෙවියන් වහන්සේට ඔප්පු කළේය" හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. මෙල්කිසදෙක්
2. ආරොන්
3. කයිපාස්
4. සෙකරියස්

(23) ඉශ්‍රායෙල් පූජා ප්‍රධාන කොටස් දෙක නම්,

1. සාම පූජා / දවන පූජා
2. පාප පූජා / වන්දි ගෙවීමේ පූජා
3. නොදවන පූජා / සහභාගිකමේ පූජා
4. දවන පූජා / නොදවන පූජා

(24) ආගම් භේද නොතකා ජුදා සිනගෝගයට හා මුස්ලිම් පල්ලියකට වැඩම කළ පළමු ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

1. ශුද්ධ වූ XII වෙනි පියුස් ශුද්ධෝත්තම පියතුමා
2. ශුද්ධ වූ II වෙනි ජුවාම් පාවුලු මුනිතුමා
3. ශුද්ධ වූ VI වෙනි පාවුලු ශුද්ධෝත්තම පියතුමා
4. ශුද්ධ වූ XVI වෙනි බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා

(25) " මට ගෙයක් දෙන්න මැරෙන්න වැටී සිටින අයව මම බලා ගන්නම්" කියා පැවසුවේ කා විසින් කා හටද?

1. ශුද්ධ වූ මැක්සිමිලියන් කොල්බේ මුනිතුමා විසින් නාසිවරුන්ට
2. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා විසින් කන්ද උඩරට රජතුමාට
3. භාග්‍යවත් තෙරේසා මව් තුමිය විසින් ප්‍රාදේශීය නායකයන්ට
4. ශුද්ධ වූ පාවුලු තුමා විසින් නීරෝ අධිරාජ්‍යයාට

(26) පළමු දේව පනතට විරුද්ධ ක්‍රියා වන්නේ,

A. මූලධර්ම වාදීන් පසුපස යාම
B. කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම
C. දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම අතපසු කිරීම
D. සාත්තර ඇසීම

මෙවායින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා B ය    2. A, B හා C ය    3. A,C හා D ය    4. B හා D ය

(27) තම ගැලවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යැයි බලාපොරොත්තු නොවීම,

1. ඉච්ඡාභංගත්වය යි    2. උඩගුවීම යි
2. අනුමානය යි    3. ව්‍රත ශුද්ධිය යි

(28) "ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ .................................... වන්නේය. මතෙව් 20:26 අනුව නිවැරදි පිළිතුර වන්නේ,

1. සේවකයා    2. ස්වාමියා    3. පාලකයා    4. දාසයා

(29)

| දේව පනත් | දේව පනත් වලට විරුද්ධ ක්‍රියා |
|---|---|
| (01) ...................... | දෙමාපියන් ලබා දුන් නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීම |
| (02) ...................... | බොරු නඩු වලට පටලැවීම |
| (03) ...................... | අසභ්‍ය පොත් පත් හා නිල් චිත්‍රපට බැලීම |

ඉහත අංක (01), (02), (03) හිස්තැන් වලට යෝග්‍ය දේව පනත් වන්නේ,

1. හතරවන දේව පනත / පස්වන දේව පනත / 6 හා 9 වන දේව පනත්
2. පස්වන දේව පනත / අටවන දේව පනත / 7 හා 10 වන දේව පනත්
3. හතරවන දේව පනත / හත්වන දේව පනත / 9 වන දේව පනත
4. තුන්වන දේව පනත / අටවන දේව පනත / 6 වන දේව පනත

(30) "යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට සතර ගුණයක් ආපසු දෙමි" මෙය කා විසින් කා හට පවසන ලද්දක්ද?

1. පේදුරු තුමා විසින් ජේසුස් වහන්සේට    2. සකේවුස් විසින් ජේසුස් වහන්සේට
3. ජුදා ජාතීන් විසින් දෙවියන් වහන්සේට    4. පාරාවෝ රජ විසින් මෝසෙස් තුමාට

(31) මයසීදාව ඇතිව දිවි ගෙවීමට අප කළ යුත්තේ,

A. යාච්ඤා කිරීම    B. දිනපතා පුවත්පත් කියවීම
C. ශුද්ධ බයිබලය කියවීම    D. දිව්‍ය පූජාවට සහභාගී වීම

මින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A,B හා C ය    2. B,C හා D ය    3. A,C හා D ය    4. A හා D ය

(32) වෘත්තීමය රහස් රැකීමට බැඳී සිටින්නේ,

1. දේශපාලනඥයන් / කම්කරුවන්
2. වෛද්‍යවරුන් / ධීවරයන්
3. රාජ්‍ය සේවකයන් / සොල්දාදුවන්
4. නීතිඥයන් / වෙළෙන්දන්

(33) පාස්කු ඉරිදායින් දින 40 කට පසු පවත්වන මංගල්‍යය වන්නේ,

1. පෙන්තකොස්ත මංගල්‍යය
2. කානික්ක මංගල්‍යය
3. ශුද්ධ වූ පවුලේ මංගල්‍යය
4. ස්වර්ගාරෝහන මංගල්‍යය

(34) ගොබ් ඉරුදින හා මහ සිකුරාදා දින භාවිතා වන වර්ණය වන්නේ,

1. දම්
2. රතු
3. සුදු
4. කොළ

(35) දිව්‍ය පූජාවේදී දක්නට ලැබෙන මූලසුනේ යැදුම් වන්නේ,

1. පොදු යැදුම් / පඬුරු මත යැදුම්
2. පඬුරු මත යැදුම් / පශ්චාත්තාපික යැදුම්
3. බොදුනෙත් පසු යැදුම් / ස්තෝත්‍ර යාගික යැදුම්
4. ස්තෝත්‍ර යාගික යැදුම් / පොදු යැදුම්

(36) කතෝලික සභාව පිළිගත් සභා වන්නේ,

A. එංගලන්ත සභාව
B. මූලධර්ම වාදී සභාව
C. ග්‍රීක ඔතඩොක්ස සභාව
D. බැප්ටිස් සභාව

මින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා B ය
2. A,C හා D ය
3. B හා C ය
4. A,B හා C ය

(37) ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ව ද පිරිවරා ගෙන ස්වර්ගික පියාණන් වහන්සේට කළ යාච්ඤාව වන්නේ,

1. ස්වාමිවාක් ආරාධනාවයි
2. මල් උයනේ යාච්ඤාවයි
3. උත්තම පූජක යාච්ඤාවයි
4. රැකවල් දේව දූතයාගේ යාච්ඤාවයි

(38) දිව්‍ය පූජාව තුළ ආරම්භයේදී දක්නට ලැබෙන ගෞරවයේ සංකේතය වන්නේ,

1. නමස්කාරය / වයින්
2. මල් / ආසිරි පැන්
3. පූජාසනය සිපාචාරය / ධූප
4. සුවඳ දුම් / දල්වන ලද පහන්

(39) "කිතුනු ජීවිතය රඳා පවතින්නේ......................... මතය" හිස් තැනට අදාල පිළිතුර වන්නේ,

1. යාච්ඤාව
2. ශුද්ධ බයිබලය
3. භක්ති අභ්‍යාස
4. දිව්‍ය පූජාව

(40) "මරිය තුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානය ආරම්භ කළේ,

1. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
2. ශුද්ධ වූ මරිය ගොරෙන්ති තුමිය
3. ශුද්ධ වූ තෙරේසා මුනිතුමිය
4. ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) I. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
II. කතෝලික සභාව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් කිතුනු සහා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇති ප්‍රකාශන දෙකක් නම් කරන්න.
III. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් ලියන්න.
IV. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක ලියන්න.
V. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතර ලියන්න.
VI. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා සිදුකළ ප්‍රාතිහාර්ය දෙකක් ලියන්න.
VII. ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති පොත් දෙක නම් කරන්න.
VIII. සංදේශ වර්ගීකරණයේ වෙනත් හසුන් ලියූ අපෝස්තුලුවරුන් දෙදෙනෙක් නම් කරන්න.
IX. සන්තියාගෝ මුනිතුමාගේ හිස ගසා මරා දමනු ලැබුවේ කවුද?
X. ස්වර්ගාරෝහණ මංගල්‍යයෙන් දින 10 කට පසුව සමරන්නේ කිනම් මංගල්‍යයද?

(ලකුණු 2 X 10 = 20 යි)

(02) I. මිසරයේ වහල් බවින් ඉශ්‍රායෙල් ජනතාව බේරා ගැනීමට යැවූ පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
II. ඉශ්‍රායෙල් ජනයා මිසරයේ කළ වහල් සේවා තුනක් ලියන්න.
III. නික්මයාම ගමනේදී ඉශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ අත් දුටුවාක් මෙන් ඔබේ ජීවිතය තුළ දෙවියන් වහන්සේ අත් දුටු ආකාරය වචන 75 කින් විස්තර කරන්න.

(ලකුණු 2+3+5 =10 යි)

(03) I. ශුද්ධ වූ ලූක් තුමා පිළිබඳ කරුණු දෙකක් ලියන්න.
II. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්ම ලියා දක්වන්න.
III. පාසල් සිසුවෙකු / සිසුවියක වශයෙන් ජේසුස් වහන්සේගේ ශුභාරංචිය අන්අය වෙත ගෙන යාමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග පහක් ලියා විස්තර කරන්න.

(04) I. ජේසුස් වහන්සේ පේදුරු තුමාට තමා අනුගාමික වන්නට ආරාධනා කරමින් ප්‍රකාශ කළ වචන මොනවාද?
II. පේදුරු තුමාගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණු තුනක් ලියන්න.
III. ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස කටයුතු කිරීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියා විස්තර කරන්න.

(05) I. හතර වන දේව පනත නම් කරන්න.
II. හතරවන දේව පනතට විරුද්ධව කරන ක්‍රියා තුනක් ලියන්න.
III. "දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම්" යන මාතෘකාව යටතේ වචන 75 කට නොඅඩු පුවත් පතකට ලිපියක් ලියන්න.

(06) I. දිව්‍ය පූජාවේ පළමු හා දෙවන වසර සඳහා භාවිතා වන ශුභාරංචි මොනවාද?
II. උත්තම පූජක යාච්ඤාවේ කොටස් තුන ලියා දක්වන්න.
III. දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියා විස්තර කරන්න.

(07) කෙටි සටහන් දෙකක් ලියන්න. (පේලි දොලහකට නොඅඩු වන සේ)
I. ජීවන සහා සම්ප්‍රදාය
II. ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය
III. භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
IV. ආගමන සමය